# 2.12 ආදි වාසී ළමා සමාජය පිළිබඳ අධ්‍යයනයක්

සමන් රාජපක්ෂ
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

විලියම් වර්ඩ්ස් වර්ත් කවියා පැවසූ පරිදි ළමයා යනු වැඩිහිටියාගේ පියාය. සමාජයක පැවත්ම කෙරෙහි ළමයාගේ ක්‍රියාකාරීත්වය අතිශයින් වැදගත් වේ. ඕනෑම සමාජයක අනාගතය ගොඩනැවීම උදෙසා එහි ළමා සමාජය ශක්තිමත් පදනමක් සකසයි. එබැවින් ළමයාගේ සමාජානුයෝජන ක්‍රියාවලිය සඳහා සමාජ සංස්කෘතියේ සුවිශේෂී ස්ථානයක් හිමිවේ. එය ළමයා සහ සමාජය අතර පවත්නා සබඳතාවයේ වර්ධනීය අවස්ථාවක් වශයෙන් පෙන්වා දිය හැකිය. ළමයා හා සම්බන්ධ මෙම ස්වභාවයන් ලෝකයේ සෑම ළමා ප්‍රජාවකට පොදු වූවකි. සමාජ මානව විද්‍යාවේ ආදිවාසීන් හෙවත් වැදි ජනයාගේ ළමා සමාජය සම්බන්ධයෙන්ද, ළමයා පිළබඳව සිදු කෙරුණු මෙම විග්‍රහය වැදගත් වේ. මෙම අධ්‍යයනයේ දී මාගේ අරමුණ වූයේ සමාජ සංවර්ධනය අතින් තවමත් ප්‍රාථමික මට්ටමක පසුවන, දැනුම, ආකල්ප සහ හැකියාවන් පුළුල් පරාසයක පැතිරී නොමැති, විවිධ සමාජ විෂමතාවන්ගෙන් පීඩා විදින, නමුත් ආදිවාසීන්ගේ අනාගත පැවැත්මේ නියමුවන්වන ආදිවාසී ළමා සමාජයේ නූතන ස්වභාවය සහ ඔවුන්ගේ අනාගත ක්‍රියාකාරීත්වය කෙසේ වේද යන්න පිළිබඳව විමසා බැලීමයි.

දඹාන ආදිවාසී ළමා ප්‍රජාව ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය සිදුකරන ලද අතර ළමයින්ගේ පාසල් අධ්‍යාපන ක්‍රියාකාරකම් සහ ඔවුන්ගේ සමාජ ජීවිතයට අදාළ හැසිරීම් මෙහිදි ගවේෂණය කරන ලදී. ප්‍රශ්නමාලා ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය දත්ත රැස් කිරිමේ ක්‍රමවේද වශයෙන් භාවිතා කළේය.

දඹාන ආදිවාසී ග්‍රාමය හා ඒ අවට ප්‍රදේශය තුළ ආදිවාසී ක්‍රමයට නැඹුරුතාවක් දක්වන දරුවන් සේ ම ආදිවාසී ජීවන ක්‍රමයෙන් මිදී සාමාන්‍ය සිංහල සමාජ ජීවිතයට ඇලුම් කරන දරුවන් ජීවත් වේ. පොදුවේ මේ දෙපාර්ශවයට ම බලපාන ගැටළු රාශියක් පවතී. නමුත් ආදිවාසී ක්‍රමයෙන් මිදී සමාන්‍ය ජීවිතයට හුරු වූ දරුවන් අධ්‍යාපනික වශයෙන් දියුණුවක් ලබා ඇත. ඔවුන් සුභවාදී ආකල්පයන්ගෙන් යුක්තය. නමුත් ආදිවාසී සමාජ රාමුව තුළ ජීවත් වන දරුවන්ගේ ජීවිතය පවත්නේනේ ප්‍රබල අර්බුදයකයි. මතුපිටින් එය දෘෂ්‍යමාන නොවන අතර ඔවුන්ගේ ජීවන රාටාවේ අභ්‍යන්තරයට එබී බැලූ විට ඔවුන් මුහුණපා ඇති ව්‍යසනකාරී ජීවන ස්වභාවයන් හඳුනාගත හැකි වේ. මෙහි නවතම තත්වය වන්නේ මේ දරුවන් හට ආදිවාසී සමාජය හෝ නවීන සමාජය උරුම නොවීමයි. බොහෝ ළමයින් ආදිවාසීකම ලේබලයක් පමණි. මෙම අධ්‍යයනයට අනුව පෙනී ගියේ ආදිවාසී දරුවන් යනු උග්‍ර සම්පත් හිඟයකට ගොදුරු වී ඇති කිසිදු සමාජ වරප්‍රසාදයක් හෝ අයිතිවාසිකම් භුක්ති නොවිදන ව්‍යාකූලත්යකට පත් ළමා ප්‍රජාවක් බවයි.

මූල පද -: ආදිවාසී ළමා සමාජය, සමාජ මානව විද්‍යාව